**දේශගුණික අවබලපෑම් අවම කිරීමේ ව්‍යාපෘතිය - 2021 ජනවාරි 01 සිට ඔක්තෝම්බර් 15 දක්වා කාලසීමාව සඳහා**

---

දේශගුණික අවබලපෑම් අවම කිරීමේ ව්‍යාපෘතියේ 2021 ජනවාරි 01 සිට ඔක්තෝම්බර් 15 දක්වා කාලසීමාව සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ජාත්‍යන්තර සංවර්ධන සංගමය අතර 2014 ජූලි 10 දින එළඹි අංක 5417- එල්කේ දරන මූල්‍ය ගිවිසුමෙහි 2 උපලේඛනයේ II සී කොටසේ සහ 2010 ජූලි 31 දිනැති ජාත්‍යන්තර සංවර්ධන සංගමයේ ණය සහ ප්‍රදාන සඳහා වූ සාමාන්‍ය කොන්දේසිවල 4:09(ආ) වගන්තිය සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

ව්‍යාපෘතියේ මූල්‍ය ගිවිසුම අනුව, කෘෂිකර්ම, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය, වර්තමානයේ වාරිමාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර, වාරිමාර්ග දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, මාර්ග සංවර්ධන අධිකාරිය සහ ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. මෙම ව්‍යාපෘතියේ අරමුණු වූයේ දේශගුණික අවදානම්වලට නිරාවර්තිත ජනයා හා වත්කම් ගොදුරුවීම් සඳහා නතුවීමට ඇති අවකාශය අවම කිරීම හා ආපදාවන්ට සඵලදායී ලෙස ප්‍රතිචාර දැක්වීම සඳහා ලබන්නන්ගේ ධාරිතාවය වැඩිදියුණු කිරීම යි. මූල්‍ය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු වියදම රුපියල් මිලියන 14,617 කට සමාන ඇමෙරිකන් එක්සත් ජනපද ඩොලර් මිලියන 111.8 ක් වන අතර මින් රුපියල් මිලියන 14,382 කට සමාන ඇමෙරිකන් එක්සත් ජනපද ඩොලර් මිලියන 110ක් මූල්‍යායනය කිරීමට ජාත්‍යන්තර සංවර්ධන සංගමය එකඟවිණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2014 අගෝස්තු 05 දින ආරම්භ කරන ලද අතර 2020 දෙසැම්බර් 31 දින වනවිට අවසන් කිරීමට නියමිතව තිබුණි. කෙසේවුවද, ව්‍යාපෘතියේ කටයුතු අවසන් වන දිනය 2021 ඔක්තෝම්බර් 15 දින දක්වා දීර්ඝ කර තිබුණි.

## 1.3 මතය

ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 ඔක්තෝම්බර් 15 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් කාලසීමාව සඳහා වියදම් ප්‍රකාශනය හා එහි මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

## 2. භෞතික කාර්යසාධනය

### 2.1 කොන්ත්‍රාත් කළමනාකරණය

| අංකය | විගණන නිරීක්ෂණ | කළමනාකරණ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| (අ) | ක්‍රියාත්මක කිරීමේ නියෝජ්‍යාතන පහ විසින් ප්‍රධාන සංරචක හතරක් යටතේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර තිබුණි. මූල්‍ය ප්‍රකාශන අනුව රුපියල් මිලියන 11,830ක් වටිනා ප්‍රාග්ධන වැඩ ජංගම නොවන වත්කම් යටතේ හඳුනාගෙන තිබුණි. ව්‍යාපෘතිය 2021 ඔක්තෝම්බර් 15 දින අවසන් කළද, 728ක මෙම ඉදිකිරීම් | දේශගුණික අවබලපෑම් අවම කිරීමේ ව්‍යාපෘතියේ සමස්ථ ව්‍යාපෘති වියදම භාණ්ඩාගාර ගිණුම් යටතේ ප්‍රාග්ධන වියදම් ලෙස ගිණුම්ගත කෙරුණි. මෙම වටිනාකම අදාළ ක්‍රියාත්මක කිරීමේ නියෝජ්‍යාතන විසින් නැවත ගිණුම්ගත කිරීම අත්‍යාවශ්‍ය නොවේ. | ව්‍යාපෘතිය අවසානයේ වත්කම් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ නියෝජ්‍යාතනයට වත්කම් පැවරිය හැකිවන පරිදි ලේඛනය පවත්වා ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | කටයුතු අදාළ ආයතන වෙත විධිමත්ව පැවරීමට කටයුතු කර තිබුණි. එබැවින්, ඉහත වත්කම් අදාළ ආයතනවල ස්ථාවර වත්කම් ලෙස විධිමත්ව ගිණුම්ගත කර ඇති බවට තහවුරු කරගත නොහැකි විය. | | |
| (ආ) | මුළු ප්‍රමාණ බිල්පත් අගය රුපියල් මිලියන 230.5ක් වූ කොන්ත්‍රාත් පැකේජ 15ක් 2015 -2017 කාලසීමාව තුලදී රුපියල් මිලියන 91.1ක් ගෙවීමෙන් පසුව නවතා දමා තිබුණි. කොන්ත්‍රාත් ගිවිසුම අනුව අදාළ කොන්ත්‍රාත්කරුට විරුද්ධව කටයුතු කර නොතිබුණි. තවද, අරමුදල් නිදහස් කිරීම 2021 ඔක්තෝම්බර් 15 දින වසා ඇති අතර, ඉතිරි වැඩ සම්පූර්ණ කිරීම සඳහා විකල්ප අරමුදල් සපයාගැනීමේ ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි. | ඉතිරි වැඩවලින් කොටසක් වාර්ෂික අයවැය යටතේ රුපියල් මිලියන 1.25ක වටිනාකමකට 2021 වර්ෂයේදී සම්පූර්ණ කර ඇත. ඉතිරි වැඩ ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ වාර්ෂික අයවැය යටතේ ඉදිරියේදී ඉටු කිරීමට අදහස් කර ඇත. | අනාර්ථික වියදම් අදාළ පාර්ශවයෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ඇ) | කොළඹ- රත්නපුර මාර්ගයේ පාලම් දෙකක් ඉදිකිරීම සඳහා රුපියල් මිලියන 225ක පිරිවැයකට 2017 පෙබරවාරි 17 දින ගිවිසුමක් අත්සන් කර තිබුණු අතර, ඉඩම් අත්පත්කර ගැනීමෙන් තොරව ව්‍යාපෘතිය විසින් අත්තිකාරම් ගෙවා තිබුණි. අනතුරුව, වැඩබිම සඳහා ප්‍රවේශයක් නොතිබීම හේතුවෙන් ගිවිසුම අන්‍යොන්‍ය වශයෙන් අවසන් කර තිබුණි. එබැවින්, රුපියල් මිලියන 71.3ක් ව්‍යාපෘතියට අනාර්ථික වියදමක් වී තිබුණි. | මාර්ග සංවර්ධන පනතේ ඉඩදී ඇති ඉඩම් මිලදී ගැනීම මගින් අත්පත් කර ගැනීමේ අපේක්ෂාවෙන් කොන්ත්‍රාත්තුව පිරිනමා ඇත. මහමාර්ග අමාත්‍යාංශය අනුගමනය කරන වර්තමාන මැනුම් ක්‍රමය අනුව උපරිම ගැනුම් මිල විය යුත්තේ තක්සේරු දෙපාර්තමේන්තුවේ තක්සේරුවට වඩා සියයට 10ක් වැඩියෙන් පමණි. මෙම ඉඩම් ඒ4 මාර්ගය දිගේ පිහිටා ඇතත්, මෙම සියළු ඉඩම් ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ කුඹුරු ඉඩම් ලෙස ලේඛනගත කර ඇති හෙයින් මෙම ඉඩම්වල තක්සේරුව ඉතා අඩුය. එබැවින්, ඉඩම්හිමියන් තක්සේරුව සඳහා එකඟ නොවන අතර, සාමාන්‍ය ඉඩම් අත්පත් කරගැනීමේ ක්‍රියාවලිය අනුගමනය කිරීමට අමාත්‍යාංශය තීරණය කර තිබුණි. | අනාර්ථික වියදම් අදාළ පාර්ශවයෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ඈ) | ද්‍රෝණි ආයෝජන සැගැස්ම යෙදවීම සඳහා සංරචක 1 යටතේ එකතුව ඇමෙරිකානු ඩොලර් මිලියන 21.5ක් වෙන් කර තිබුණි. කෙසේවුවද, ව්‍යාපෘතිය අවසන් වන විට ඇමෙරිකානු ඩොලර් මිලියන 12.77ක් පමණක් උපයෝජනය කර තිබුණි. | ව්‍යාපෘති පිරිවැය ඇස්තමේන්තු උපකල්පන මත පිළියෙළ කර ඇත. එය ව්‍යාපෘතියට වාසියක් වන අතර, ඉතුරුම් අනෙකුත් සංරචක සඳහා යොදාගෙන ඇත. | රේඛීය නියෝජ්‍යාතන සමඟ විධිමත් සමායෝජනයක් පවත්වා ගත යුතු අතර, විදිමත් සැළසුම්කරණය මත පිරිවැය ඇස්තමේන්තු පිළියෙළ කළ යුතුවේ. |